# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION

සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No: 10120

ෆැක්ස් / தொலைநகல / Fax: 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone: 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site: www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail: dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO: 754 / 2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No: / 2024

දිනය / திக / Date: 04/05/2024 පැය 0540

## මාධ්‍ය නිවේදනය

**01. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - ගම්පහ පොලිස් ස්ථානය.**

2024.05.03 වන දින සවස් කාලයේ ගම්පහ පොලිස් වසමේ ලොව්ගහමුල්ල හන්දියේදී ගම්පහ පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 10 මිලිග්‍රෑම් 200 ක් සමඟ සැකකරුවෙකු** අත්අඩංගුවට ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 38 ක් වන මාකිලන්ගමුව, ගම්පහ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

ගම්පහ පොලීසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**02. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - හබරාදූව පොලිස් ස්ථානය.**

2024.05.03 වන දින රාත්‍රී කාලයේ හබරාදූව පොලිස් වසමේ යටගල ප්‍රදේශයේදී හබරාදූව පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් යුක්තිය මෙහෙයුමට අදාලව සිදු කරන ලද වැටලීමකදී **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 03 මිලිග්‍රෑම් 600 ක් සමඟ සැකකරුවෙකු** අත්අඩංගුවට ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 29 ක් වන හීනටිගල, තල්පේ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

හබරාදූව පොලීසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**03. දේපල සොරකමක් සම්බන්ධව සැකකරුවෙකු අත්අඩංගුවට - ගල්කිස්ස පොලිස් ස්ථානය.**

ගල්කිස්ස පොලිස් වසමේ අත්තිඩිය ප්‍රදේශයේ පාසලක සිදුවූ දේපල සොරකමක් සම්බන්ධව ගල්කිස්ස පොලිස් ස්ථානයට කරන ලද පැමිණිල්ලක් මත විමර්ශන

සිදුකර සිද්ධියට සම්බන්ධ සැකකරුවෙකු 2024.05.03වන දින අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු අවුරුදු 37 ක් වන යශෝධරාපුර, අත්තිඩිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

සැකකරු සන්තකයේ තිබී යකඩ ඇඳක්,වතුර ටැංකියක්, මෙට්ටයක්, ඇළුමිනියම් දොරක්, විදුලි පංකාවක් ඇතුළු දේපල රැසක් සොයා ගෙන ඇත. ගල්කිස්ස පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 04. බලපත්‍ර නොමැතිව මැණික් ගරමින් සිටි පුද්ගලයින් දෙදෙනෙකු අත්අඩංගුවට - මස්කෙළිය පොලිස් ස්ථානය.

2024.05.03 වන දින සවස් කාලයේ මස්කෙළිය පොලිස් වසමේ මස්කෙළිය හන්දිය ආසන්න ප්‍රදේශයේදී කොට්ඨාස වැටලීම් නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **බලපත්‍ර නොමැතිව මැණික් ගැරූ පුද්ගලයින් දෙදෙනෙකු මැණික් ගැරීමට උපයෝගී කර ගත් උපකරණ සමග අත්අඩංගුවට ගෙන මස්කෙළිය** පොලිස් ස්ථානයට ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 42 හා 45 යන වයස් වල පසුවන මස්කෙළිය ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

මස්කෙළිය පොලීසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 05. මෘත ශරීරයක් හමුවීම - එරාවූර් පොලිස් වසම.

2024.05.03 වන දින උදෑසන කාලයේ එරාවූර් පොලිස් වසමේ චෙංකලඩි ප්‍රදේශයේ පාලු නිවසක් පිටුපස පිරිමි මළ සිරුරක් ඇති බවට ලද පණිවිඩයක් මත එරාවූර් පොලිසිය විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 31 ක් වන චෙංකලඩි ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය මහෙස්ත්‍රාත් පරික්ෂණයෙන් පසු පශ්චාත් මරණ පරීක්ෂණය සඳහා මඩකලපුව රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. මෙම මරණය යම් සාහසික ක්‍රියාවක් හේතුවෙන් සිදුවූ මරණයක්ද නොඑසේනම් වෙනත් කාරණයක් ද යන්න සම්බන්ධයෙන් එරාවූර් පොලිසිය වැඩිදුර විමර්හන සිදුකරනු ලබයි.

## 06. දියේ ගිලී මියයාමක් - නිවිතිගල පොලිස් වසම

2024.05.03 වන දින අළුයම් කාලයේ නිවිතිගල පොලිස් වසමේ ජයපුරගම ප්‍රදේශයේ දැල වේ ගඟට වැටී පුද්ගලයෙකු දොඹගම්මන රෝහලට ඇතුළත් කිරීමේදී මියගොස් ඇති බවට නිවිතිගල පොලිස් ස්ථානයට ලද පණිවිඩයකට අනුව විමර්ශනයක් ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 31 ක් වූ ජයපුරගම, ගල්තලාව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මරණකරු දැල වේ ගඟේ පතලක් මුරකරමින් සිටියදී අසනීපව ගඟට වැටි ඇති බවට විමර්ශනයේදි අනාවරණය වි ඇත. මෘත ශරීරය රත්නපුර රෝහලේ මෘත

ශරීරාගාරයේ තැම්පත් කර ඇති අතර, නිවිතිගල පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරගෙන යනු ලබයි.

## 07. දියේ ගිලී මියයාමක් - හඟුරන්කෙත පොලිස් වසම

2024.05.03 වන දින සවස් කාලයේ හඟුරන්කෙත පොලිස් වසමේ අධිකාරිගම ප්‍රදේශයේ අඹේවෙල ඔයේ ගිලී පුද්ගලයෙකු මියගොස් ඇති බවට හඟුරන්කෙත පොලිස් ස්ථානයට ලද පණිවිඩයකට අනුව විමර්ශනයක් ආරම්භ කර ඇත..

**මරණකරු වයස අවුරුදු 45 ක් වූ අබේවෙල, අධිකාරිගම ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මරණකරු තවත් පුද්ගලයෙකු සමඟ දිය නෑම සඳහා ගොස් ඇති බවත් එම අවස්ථාවේදි දියේ ගිලි ඇති බවට විමර්ශනයේදි අනාවරණ වි ඇත. මෘත ශරීරය රිකිල්ලගස්කඩ රෝහලේ මෘත ශරීරාගාරයේ තැම්පත් කර ඇති අතර, හඟුරන්කෙත පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරගෙන යනු ලබයි.

## 08. මාරක රිය අනතුරක් - කාත්තන්කුඩි පොලිස් වසම.

2024.05.03 වන දින දහවල් කාලයේදී කාත්තන්කුඩි පොලිස් වසමේ මඩකලපුව කල්මුණ මාර්ගයේ කිලෝමීටර් 420 කණුව ආසන්නයේදී මඩකලපුව දෙස සිට කල්මුණ දෙසට ධාවනය වූ යතුරුපැදියක් මාර්ගය හරහා ගමන් කල කාන්තාවක් ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ පදික කාන්තාව ආරියම්පති රෝහලට ඇතුලත් කිරීමේදී මියගොස් ඇත.

**මරණකාරිය වයස අවුරුදු 64 ක් වූ ආරියම්පති 03 ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

මෘත ශරීරය ආරියම්පති රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර කාත්තන්කුඩි පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**